ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ අංක 38 දරන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 12 සිට 19 දක්වා වූ ඡේදවල දක්වා ඇති විධිවිධානවලට අනුව හුවමාරු නොවන ගණුදෙනුවලින් පැනනගින අයභාරය හෝ නියමයන්/කොන්දේසි හෝ සීමාකිරීම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් ඊට අනුකූල නොවන සේ සමාලෝචිත වර්ෂය තුළදී රු.3,636,091 ක් හා ඉකුත් වර්ෂය තුළදී ලද රු.4,209,053 ක රාජ්‍ය ප්‍රදාන අදාළ වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීම වෙනුවට වැය නොවූ මූලධන ආධාර ලෙස ගිණුම්ගත කර තිබුණි.	රාජ්‍ය මූලධන ආධාර අදාළ මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා පමණක් ලබා දෙනු ලබන අතර, වත්කමක් ලෙස හඳුනාගත හැකි කොන්දේසි සපුරා නොමැති අවස්ථාවක වැය නොවූ මූලධන ආධාර අයභාරය ලෙස හඳුනාගත නොහැකි බව.	ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

.

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2023 වර්ෂයේදී උපාධි ලෝගු වෙනුවෙන් රු.523,267 ක ක්ෂය වෙන්කිරීම් වැඩියෙන් ගලපා තිබීමෙන් උපාධි ලෝගු ප්‍රත්‍යාගණනය කිරීමේදී ඇති වූ ප්‍රත්‍යාගණන අතිරික්තයේ වැඩිවීම නිවැරදි කිරීමට කටයුතු කර නොතිබීම නිසා සමුච්චිත	2025 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

	අතිරික්තය හා ප්‍රත්‍යාගණන ලාභය එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.		
(ආ)	2022 වර්ෂයේදී ලී බඩු සහ උපකරණ මිලදී ගැනීම සඳහා ගෙවන ලද රු.2,062,500 ක අත්තිකාරම් එම වර්ෂයේදී දෝෂ සහගතව වත්කමක් ලෙස හඳුනාගෙන තිබුණි. එම වත්කම් පන්තිය 2022 දෙසැම්බර් ප්‍රත්‍යාගණනය කිරීමේදී අත්තිකාරම් ඉවත් නොකිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. 2023 වර්ෂයේදී රු.4,743,750 ක වටිනාකමින් යුතු අදාළ ලී බඩු ආයතනය වෙත ලැබීමේදී අත්තිකාරම් අඩුකර ගෙවන ලද රු.2,681,250 ක වටිනාකම පමණක් වත්කමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් වත්කම් ගිණුම රු.2,062,500 කින් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	- එම -

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ගෙවිය යුතු ගිණුම්

විගණන නිරීක්ෂණය	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබූ රු.1,880,425 ක ශේෂය තුළ 2020 හා 2021 වර්ෂයන්ට අදාළව සිසුන්ට ගෙවිය යුතු රු.1,176,625 ක් වූ මහපොළ ශිෂ්‍යාධාර මුදල් අදාළ ශිෂ්‍යයන් වෙත ගෙවීමට හෝ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.	මේ පිළිබඳව මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලින් තොරතුරු ලබා ගැනීමට නියමිත බව හා ඒ අනුව කටයුතු කිරීමට අපේක්ෂා කරන බව.	අදාළ ශිෂ්‍යයන් වෙත කඩිනමින් ගෙවීමට හෝ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	1997 අගෝස්තු 26 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය XXII පරිච්ඡේදයේ 18.3 උපවගන්තිය සහ XXII වන පරිච්ඡේදයේ 20.1 වගන්තිය	විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර මාස 06 ක් ඇතුළත නිම කළ යුතු අතර, යම් තැනැත්තකුගේ වැඩ තහනම් කර තිබේනම් ඔහුට විරුද්ධව පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු අප්‍රමාදව අවසන් කළ යුතු වේ. එහෙත් කථිකාචාර්ය හිමි නමකට චෝදනා පත්‍රය ඉදිරිපත් කර අවුරුදු 04 ක	මූලික විමර්ශනය 2025 පෙබරවාරි 25 දිනැතිව අවසන් කොට එම වාර්තාව විශ්වවිද්‍යාලයට ලබාදීමට නියමිත බව හා එහි නිර්දේශ මත විනයානුකූලව කටයුතු කිරීමට නියමිත බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

		කාලයක් ගත වී තිබුණද විනය පරීක්ෂණය අවසන් කර විනය නියෝගයක් ලබාදීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි. විනයානුකූල කටයුතු කෙරෙමින් පවතින අවස්ථාවකදී විනය බලධාරියාගේ එකඟත්වය ඇතිව මිස ඔහුට දිවයිනෙන් බැහැරයාමට අවසර නොදිය යුතු වුවත් තාවකාලිකව සේවය අත්හිටවූ මෙම හිමිනම දින 16 ක් විනය බලධාරීන්ගේ අනුමැතියකින් තොරව දිවයිනෙන් බැහැර වී තිබුණි.		
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 570, 571 (1) හා (2) ඡේද	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 02 කට අධික කාලයක සිට පැවත එන රු.5,894,610 ක් වූ නේවාසිකාගාර හා පුස්තකාල තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ඉල්ලුම් නොකළ තැන්පතු සම්බන්ධව ප්‍රතිපත්තියක් සකස් කර අනුමත වීමෙන් පසු ආදායමට ගැනීමට නියමිත බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 7.1.4 හා 7.1.5 ඡේදය	පශ්චාත් උපාධි පාඨමාලා, පර්යේෂණ හා සංවර්ධන කටයුතු හා උපදේශක සේවා මඟින් ලබන ආදායමින් රු.3,041,003 ක් විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී මහෝපාධ්‍යාය අරමුදල වෙත මාරු කර තිබුණි.	1981 අංක 74 දරණ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ වගන්ති අංක 17 අනුව විශ්වවිද්‍යාලයට අරමුදල් ඇරීම, පාලනය හා පරිපාලනය සඳහා බලතල හිමි වී ඇති බව මෙන්ම ඒ අනුව විවිධ කාල වකවානුවල පාලක සභා අනුමැතිය මත එම අරමුදල් පිහිටුවා ඇති බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඈ)	2014 පෙබරවාරි 11 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 හි 04 (ii) ඡේදය	පර්යේෂණයක් ආරම්භ කළ දින සිට මාස 06 ක් තුළ එකී යෝජනාවට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් ලබා නොදුන් ආචාර්යවරුන් 54 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළදී රු.21,430,312 ක පර්යේෂණ දීමනා ගෙවීම් සිදුකර තිබුණි.	2023 හා 2024 වර්ෂ වලදී පිළිවෙලින් රැස්වීම් වාර හතරක් සහ පහක් අධ්‍යයන පර්යේෂණ කමිටුව රැස්වී පර්යේෂණ ප්‍රගතිය සාකච්ඡා කර ඇති අතර එහිදී එක් එක් පර්යේෂණ ඉදිරියට පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ප්‍රගතියක් ඇති	-එම-

			බවට සෑහීමකට පත් වී ඇති බව.	
(ඉ)	2019 නොවැම්බර් 25 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ 9/2019 හි 1 (i) ඡේදය	විශ්වවිද්‍යාලය සතු නිවසක් කුලියට දීමේදී මූලික වැටුපෙන් සියයට 10 ක් අඩුකර ගන්නා ලෙස දක්වා තිබුණද ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය විසින් ලබා දුන් නිවාස වෙනුවෙන් කුලී අයකිරීමේදී අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන්ගෙන් මසකට රු.1,000 ක මුදලක් සහ කණිෂ්ඨ සේවකයන්ගෙන් රු.800 ක මුදලක් පමණක් අයකර තිබුණි.	ආචාර්යවරුන්ගේ නිවාසයන්හි ඉඩ ප්‍රමාණ ඉතා සීමිත බැවින් වැටුපෙන් සියයට 10 ක් අයකිරීමට අවශ්‍ය පහසුකම් ඒ තුළ නොමැති බව හා ඒකකයක් සඳහා අයකරන රු.1,000 ට අමතරව ජල සහ විදුලි මීටර වෙන වෙනම සවිකර භාවිතා කරන ප්‍රමාණයට මාසිකව වැටුපෙන් අයකරන බව හා පැරණිම ගොඩනැගිලි කිහිපයක් අලුත්වැඩියා කර කනිෂ්ඨ සේවකයින් සඳහා ලබා දී ජලය සහ විදුලිය සඳහා පමණක් එක් අයෙකුගෙන් රු.800 ක මුදලක් අය කරන බව මෙන්ම මෙම ගොඩනැගිලි තක්සේරුකර එම වටිනාකම එහි පදිංචි ආචාර්යවරුන්ගෙන් හා කණිෂ්ඨ සේවකයින් ප්‍රමාණයට බෙදා අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව.	-එම-

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.40,594,825 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,519,743 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.43,114,568 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුනරාවර්තන වියදම් රු.38,493,006 කින් වැඩිවීම හා ක්ෂය වියදම රු.28,320,757 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ රු.651,850,054 ක් වූ සමස්ථ ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.675,549,248 ක් දක්වා සියයට 3.63 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයේ දී හා සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ ඉපයූ ආදායම පිළිවෙලින් රු.136,980,700 ක් හා රු.124,736,179 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඉපයූ ආදායම සමාලෝචිත වර්ෂයේ දී රු.12,244,527 කින් හෙවත් සියයට 8.94 කින් පහළ ගොස් තිබුණි.

ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ සමස්ථ වියදම පිළිවෙලින් රු.560,193,311 ක් හා රු.598,686,317 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 6.87 කින් ඉහළ ගොස් තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය පිළිවෙලින් 1.33 :1 ක් හා 1.25: 1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය පිළිවෙලින් 1.12 :1 ක් හා 1.04: 1 ක් වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේදී පර්යේෂණ දීමනා ලබාගත් නිලධාරීන් 43 දෙනෙකු අවසන් පර්යේෂණ වාර්තා නිකුත් කිරීමට මාස 3 සිට 10 දක්වා කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි. පර්යේෂකයන් 42 දෙනෙකු විසින් 2023 වර්ෂයේදී පර්යේෂණ කමිටු අනුමැතිය සහිතව වර්ෂයක කාලයක් තුළදී නිමකිරීමට එකඟව රු.17,944,759 ක් වූ පර්යේෂණ නිම කර නොතිබියදී සමාලෝචිත වර්ෂය තුළදී එම නිලධාරීන් සඳහා නව පර්යේෂණ යෝජනා වෙනුවෙන් රු.17,017,306 ක් පර්යේෂණ දීමනා ලෙස ගෙවා තිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට පර්යේෂණ කාලය අවසන් සියලූ නිලධාරීන් මේ වන විට අවසන් වාර්තා ලබා දී ඇති බව.	පර්යේෂණ වාර්තා නියමිත කාලසීමාව තුළදී ඉදිරිපත් කළ යුතු අතර ඉදිරිපත් නොකල නිලධාරීන් වෙත පර්යේෂණ දීමනා නොගෙවීමට කටයුතු කල යුතුය.
(ආ)	පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය මඟින් පවත්වනු ලබන ඉංග්‍රීසි ඩිප්ලෝමා පරීක්ෂණයේ 2019 සහ 2021 වර්ෂවල කථනය හා ශ්‍රවණය (EDSL 05) ප්‍රශ්න පත්‍රය සඳහා 2018 වර්ෂයේ පෙනී සිට ඉන් අසමත් වූ අපේක්ෂකයකු සඳහා විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් නොකර ඇති අවස්ථාවක සහ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිමේදී ගනු ලබන පැමිණීමේ ලේඛනයේ නියමිත ස්ථානයේ "නොපැමිණි" බවට ශාලාධිපති විසින් සඳහන් කර තිබියදී අදාළ අපේක්ෂකයා සඳහා මෙම පරීක්ෂණය සමත් වූ බවට ව්‍යාජ සහතිකයක් නිකුත් කර තිබුණි.	මෙම අපේක්ෂකයා 2018 වර්ෂයේදී කථනය හා ශ්‍රවණය (EDSL 05) ප්‍රශ්න පත්‍රය සඳහා පෙනී සිට නැති බව හා 2019 වර්ෂයේදී ඉන් ලකුණු 12 ක් ලබා ගෙන අසමත් වී ඇති බව මෙන්ම එහිදී ප්‍රශ්න පත්‍රය සඳහා ගනු ලබන පැමිණීමේ ලේඛනයේ නියමිත ස්ථානයේ "නොපැමිණි" බවට ශාලාධිපති විසින් සඳහන් කර තිබුන ද එම අත්සන් ලේඛනයේම ඉහල කෙලවරේ අදාල අපේක්ෂකයා අත්සන යොදා තිබුණු බව.	පරීක්ෂණ පවත්වා වගකිව යුතු කිලධාරීන් නිශ්චය කර සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය.
(ඇ)	විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන දෙමළ භාෂා උසස් සහතිකපත්‍ර පාඨමාලාව, දෙමළ භාෂා ඩිප්ලෝමාව, ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා පාඨමාලාව හා ඉංග්‍රීසි සහතික පත්‍ර	දෙමළ භාෂා සම්මුඛ පරීක්ෂණයේ දී කථන දක්ෂතා සහ දැනුම සැලකිල්ලට ගෙන ශ්‍රේණිගත කිරීමේ	පාඨමාලා සඳහා බඳවා ගන්නා සිසුන්ගේ සුදුසුකම් සමාලෝචනය කර

පාඨමාලාව යනාදී පාඨමාලා සඳහා පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම්වලට වඩා අඩු සුදුසුකම් සහිත ශිෂ්‍යයන් බඳවාගෙන තිබුණි.	පරීක්ෂණයට ලකුණු 70 ට වඩා අඩු වුවද එම සිසුන් සහ ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා වෙනත් ආයතන වලින් ඩිප්ලෝමා සහතික තිබුණු බැවින් හා සම්මුඛ පරීක්ෂණයේ කථන දක්ෂතා දැක් වූ සිසුන් ද පාඨමාලාව අඛන්ඩව පවත්වා ගැනීමට ලියාපදිංචි කරගෙන ඇති බව හා ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව සඳහා ප්‍රමාණවත් සිසුන් නොමැති බව.	බඳවාගැනීම් විනිවිදභාවයකින් යුක්තව සිදු කිරීමට කටයුතු කල යුතුය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විශ්වවිද්‍යාලයේ බාහිර විභාග ඒකකය සඳහා පස්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2019 ඔක්තෝම්බර් 17 දින රු.252,327,545 ක (වැට් රහිත) වටිනාකමකට පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමක් සමඟ විශ්වවිද්‍යාලය ගිවිසුම්ගත වී තිබුණු අතර ඉදිකිරීම වර්ෂයක් තුළදී නිමකළ යුතුව තිබුණි. ඉදිකිරීම් කටයුතු සම්බන්ධ අනුමැතීන් ලබාගැනීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගතවීම හා එවකට පැවති අයහපත් ආර්ථික තත්ත්වය නිසා කොන්ත්‍රාත්කරු විසින් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් 2022 ජූලි 01 වන දින ගිවිසුම අවසන් කිරීමට පාලක සභාව තීරණය කර තිබුණි. මේ අනුව ගිවිසුම අවසන් කරන අවස්ථාව වන විට මූලික කටයුතු ඉටුකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ රු.11,725,461 ක වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	අදාළ ව්‍යාපෘතියේ ඉදිකිරීම්වලට අදාළ කටයුතු මේ වන විට සිදු කරන බැවින් එම මුදල නිෂ්කාර්ය වියදමක් නොවන බව හා 2025 පෙබරවාරි 03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අදාළ ගොඩනැගිල්ල සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බැවින් අදාළ ප්‍රසම්පාදන කටයුතු හා ලංසු ඇගයීම් කමිටුව පත්කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනම් කිරීමට කටයුතු කල යුතුය.

(ආ)	(i)විදේශ සිසුන් 200 දෙනෙකු සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීම වෙනුවෙන් ඇස්තමේන්තු වටිනාකම රු.190,135,000 ක් වූ (වැට් රහිත) නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2019 ඔක්තෝම්බර් 11 වන දින ගිවිසුම්ගත වී තිබූ අතර අවස්ථා දෙකකදී දින දීර්ඝ කිරීමෙන් පසුව 2022 අගෝස්තු 30 දින නිමකළ යුතුව පැවතුණි. 2022 මැයි වන විට එම ගොඩනැගිල්ල සඳහා රු.148,336,250 ක් වැය කර භෞතික ප්‍රගතිය සියයට 75 ක් පමණ තිබියදී ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබූ අතර මෙම ඉදිකිරීම් සඳහා 2019 වර්ෂයේදී අනුමත වූ ඉතිරි මුදලින් ගොඩනැගිල්ලේ තුන්වැනි මහලේ වැඩ 2025 ජූලි 15 දින වන විට නිමකිරීම සඳහා රු.40,540,977+ (වැට්) වටිනාකමකට කොන්ත්‍රාත්කරුවකු වෙත ප්‍රදානය කර තිබුණි. 2025 ජූලි වන විට එම මහල් ඉදිකිරීම් සම්පූර්ණ කර තිබුණද කිසිදු ශිෂ්‍යයකු සඳහා නේවාසික පහසුකම් ලබාදීමට කටයුතු කර නොතිබුණි.	2024 ජනවාරි 23 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවට හා උපදෙස් අනුව මෙම ගොඩනැගිල්ල සඳහා වෙන් කළ මුදලේ ඉතිරි ප්‍රතිපාදනයෙන් අනෙක් ඉදිකිරීම් කටයුතු අදියරෙන් අදියරට ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුව කටයුතු කිරීමට තීරණය කරන ලද බවද ඒ අනුව තුන්වන මහල 2024 වර්ෂයේ අගෝස්තු මාසයේ ආරම්භ කර එහි කටයුතු අවසන් අදියරේ පවතින බවද, 2025 මැයි අවසානය වන විට තුන්වන මහලේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ බව. එසේම ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු 2025 පෙබරවාරි 03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ප්‍රතිපාදන වෙන්කර ඇති බව හා ඒ අනුව ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු වලට අදාළ ප්‍රසම්පාදන කටයුතු මේ වනවිට සිදු කරමින් පවතින බව.	මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට සහ සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
	(ii) විදේශීය සිසුන් ඉලක්ක කර ඉහළ පිරිවැයක් යටතේ මෙවැනි ව්‍යාපෘතියක් ආරම්භ කලද විශ්වවිද්‍යාලය සඳහා විදේශීය සිසුන් බඳවා ගැනීම ප්‍රමාණාත්මක මට්ටමකට ඉහළ නංවා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2021, 2022, 2023 හා 2024 වර්ෂවල (සාමාන්‍ය/විශේෂ) උපාධි සඳහා පිළිවෙලින් 18, 15, 36 ක් හා 07 ක් පමණක් විදේශීය සිසුන් බඳවා ගැනීමට හැකිවී තිබුණි.	විශ්වවිද්‍යාලයේ වසර හතරේම විදේශීය සිසුන් 80 ක් සිටින බව හා 2024/2025 අධ්‍යයන වර්ෂයට සිසුන් බඳවා ගැනීමේ දැන්වීම තානාපති කාර්යාලවලට 2024 ඔක්තෝම්බර් 02 දිනැතිව විද්‍යුත් තැපැල මඟින් යැවීමට කටයුතු කරන ලද බව.	විදේශීය සිසුන් බඳවා ගැනීම ඉහළ නංවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය විසින් ඉදිරිපත් කර තිබුණු පිරිවැය රු.3,000,000 ක් වූ ගිණුම්කරණ මෘදුකාංග පද්ධති සම්බන්ධ ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 01 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. ගිවිසුමේ සඳහන් පරිදි මොඩියුල 08 ක් නිර්මාණය හා සංවර්ධනය, ස්ථාපිත කිරීම හා පරීක්ෂාව, පද්ධතිය ආරම්භ කිරීම හා පුහුණුව සඳහා මාස 08 ක කාලයක් වෙන්කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විට එම කාලසීමාව	වැටුප් මොඩියුලය සංවර්ධනය කර මේ වන විට Parallel Run සිදු කරමින් පවතින බව හා ණයගැති, ණයහිමි, ගබඩා/ස්ථාවර වත්කම්, ආයෝජන හා අරමුදල් කළමනාකරණය සහ අයවැය හා අධීක්ෂණ යනාදී මොඩියුලවල කටයුතු අවසන් කිරීමේ කාලරාමු මෘදුකාංග සංවර්ධනය කරනු ලබන ආයතනයෙන් ලබා	ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය නියමිත පරිදි සංවර්ධනය කර අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.

පසු වී මාස 17 ක පමණ කාලයක් ගතවී ඇතත් ඉන් මොඩියුල 6 ක් නිමකර විශ්වවිද්‍යාලය වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි.	ගැනීමට නියමිත බව.	

3.3 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසානය වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 23 ක පැවති පුරප්පාඩු හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගෙන සමාලෝචිත වර්ෂය තුළදී පමණක් බාහිර කථිකාචාර්යවරුන් සඳහා දීමනා ලෙස රු.11,296,791 ක් වැය කර තිබුණි. එම වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 73.8 කින් ඉහළ ගොස් තිබුණි. භාෂා අධ්‍යයන පීඨයේ දේශන පැය වලින් සියයට 44 ක ප්‍රතිශතයක්ද, බෞද්ධ අධ්‍යයන පීඨයේ දේශන පැයවලින් සියයට 44 ක්ද, බාහිර කථිකාචාරුයවරුන්ගෙන් ආවරණය කර ගෙන තිබුණි.	පුරප්පාඩු පවතින තනතුරු සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට නියමිත බැවින් බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම ඉදිරියේදී තවදුරටත් අවම කර ගැනීමට හැකි වන බව.	පුරප්පාඩු පිරවීමට හා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාලය දරන පිරිවැය අඩුකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ශිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 වාර්ෂික වාර්තාව

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	(i) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 රාජ්‍ය ව්‍යාපාර යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 අනුව විශ්වවිද්‍යාලයේ එක් එක් පාලක සභා සමාජිකයින් පිළිබඳව කරුණු වාර්ෂික වාර්තාවේ ඇතුලත් කළ යුතු වුවද, විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තාවේ එම කරුණු ඉදිරිපත් කර නොතිබුණි.	මෙය 2024 වාර්ෂික වාර්තාවේ කෙටුම්පත බැවින් පාලක සභා සාමාජිකයින්ගේ නම සහ අදාළ තනතුර ඇතුළත් කර ඇති නමුත් සම්පූර්ණ විස්තර සහිත පාලක සභා සාමාජිකයින්ගේ තොරතුරු භාෂාත්‍රයෙන්ම සකස් කිරීමට නියමිත සම්පූර්ණ වාර්ෂික වාර්තාවට ඇතුළත් කරන බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
	(ii) වාර්ෂික වාර්තාව සැකසීමේදී ආයතන සඳහා මාර්ගෝපදේශයක් ලෙස ඇමුණුම III ඉහත චක්‍රලේඛය මගින් හඳුන්වාදී තිබුණද විශ්වවිද්‍යාලය විසින් පිලියෙල කරන ලද වාර්ෂික වාර්තාව ආකෘතියට අනුව කරුණු ඉදිරිපත් කර නොතිබුණි.	චක්‍රලේඛය අනුව අදාළ ආකෘතියේ සඳහන් පරිදි අදාළ වාර්තා භාෂාත්‍රයෙන්ම සකස් කිරීමට නියමිත සම්පූර්ණ වාර්ෂික වාර්තාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	- එම -